# අධ්‍යාපන අමාත්‍යාංශය

# සී/ස නිපුණතා සංවර්ධන අරමුදල

The Nation's Leader in Skills Development

# තනතුරු පුරප්පාඩු

**අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පවතින සී/ස නිපුණතා සංවර්ධන අරමුදලේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකාවේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 1. සේවා ගණය : ජ්‍යෙෂ්ඨ කළමනාකාර (HM 1-1)

**තනතුර : සාමාන්‍යාධිකාරී තනතුරු සංඛ්‍යාව- 01**

- **සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන්-**

(අ) අධ්‍යාපන සුදුසුකම් -

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජ විද්‍යාව / ආර්ථික විද්‍යාව / ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය උපාධියක් සමඟ පශ්චාත් උපාධියක් හෝ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය ලබා තිබීම

සහ

(ආ) පළපුරුද්ද-

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක කළමනාකාර මට්ටමේ තනතුරක අවම වශයෙන් වසර 15 ක පළපුරුද්දක් තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්-**

"කළමනාකාර" සේවා ගණයෙහි I වන ශ්‍රේණියෙහි අවම වශයෙන් වසර 5 ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වයස් සීමාව -**

වයස අවුරුදු 40ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

- **වැටුප් කේතය හා වැටුප් පරිමාණය -**

HM 1-1-2016–Rs.80,295 - 15x2,270–114,345

## 2. සේවා ගණය : කණිෂ්ඨ කළමනාකාර (JM 1–1)

**තනතුර : වැඩසටහන් නිලධාරී තනතුරු සංඛ්‍යාව- 02**

- **සුදුසුකම්**

අධ්‍යාපන සුදුසුකම් -

**බාහිර අයදුම්කරුවන් -**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළව උපාධියක් ලබා තිබීම සමග උපාධිය ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අදාළ ක්ෂේත්‍රයක අවම වශයෙන් එක් අවුරුද්දක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් -**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඕනෑම විෂය ක්ෂේත්‍රයකට අදාළව උපාධියක් ලබා තිබීම සමග උපාධිය ලැබීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයෙහි "කළමනාකරණ සහකාර" (තාක්ෂණ) සේවා ගණයේ තනතුරක අවම වශයෙන් වසර එක (01) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

(ආ) අදාළ ක්ෂේත්‍රයෙහි "කළමනාකරණ සහකාර (තාක්ෂණ) සේවා ගණයේ II වන ශ්‍රේණියේ තනතුරක වසර (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

- **වයස් සීමාව -**

අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- **වැටුප් කේතය හා වැටුප් පරිමාණය -**

JM 1-1-2016–Rs.42,600 - 10 X755 - 18 X 1,135- 70,580

## 3) සේවා ගණය : කළමනාකරණ සහකාර - තාක්ෂණ (MA2-2)

**තනතුර : පුහුණු උපදේශක තනතුරු සංඛ්‍යාව -01**

- **සුදුසුකම්**

අධ්‍යාපන සුදුසුකම් -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

- සිංහල / දෙමළ
- ඉංග්‍රීසි භාෂාව
- ගණිතය

ඇතුළුව විෂයන් (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරකදී විෂයයන් (06) කින් සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියළුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

**තාක්ෂණික නිපුණතා / ප්‍රවීණතා -**

රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයකින් පුහුණු කිරීමට නියමිත වෘත්තීය ක්ෂේත්‍රයට අදාළව පුහුණු කිරීම හෝ දේශන පැවැත්වීම පිළිබඳව අවම වශයෙන් අවුරුදු තුන (03) ක පළපුරුද්දක් ලබා තිබීම.

- **වයස් සීමාව -**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- **වැටුප් කේතය හා වැටුප් පරිමාණය -**

MA 2 – 2 - 2016 - Rs.30,310 - 10 X300 - 7 X 350 – 4 x600 – 20 x710 – 52,360

## 4) සේවා ගණය : කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) (MA1-1)

**තනතුරු නාමය : කළමනාකරණ සහකාර තනතුරු සංඛ්‍යාව -02**

- **සුදුසුකම්**

**බාහිර අයදුම්කරුවන් -**

අධ්‍යාපන සුදුසුකම් -

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

i. සිංහල / දෙමළ
ii. ගණිතය
iii. ඉංග්‍රීසි භාෂාව

යන විෂයයන් ඇතුළුව විෂයන් හතර (04) කට සම්මාන සහිතව එකවර විෂයයන් හයකින් (06) සමත්ව තිබීම.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් -**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය – ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත 'ආ', 'ඇ' සහ 'ඉ' සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මේ සඳහා අයදුම් කළ හැකිය.

(ආ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී,

- සිංහල / දෙමළ
- ගණිතය

යන විෂයන් ඇතුළුව විෂයන් (04) කට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකින් විෂයයන් හය (06) ක් සමත්ව තිබීම.

පරිගණක වදන් සැකසුම / යතුරු ලියනය පිළිබඳ තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා පාඨමාලාවක් හදරා තිබීම හෝ වෙනත් ඒ හා සමාන මට්ටමේ නිපුණතාවත් අතිරේක සුදුසුකම් වශයෙන් සලකනු ලැබේ.

(ඇ) නිපුණතා සංවර්ධන අරමුදලේ සේවකයෙකු ලෙස ස්ථිර පත්වීම් දැරිය යුතු අතර, එම පත්වීම් වල ස්ථිර කරනු ලැබ සිටිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙයින් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

- **වයස් සීමාව -**

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

- **වැටුප් කේතය හා වැටුප් පරිමාණය -**

MA1-1- 2016 – Rs.27,910 - 10 X300 - 7X 350–4 x495 – 20 x660 – 48,540

**වෙනත්:**

**සෑම ඉල්ලුම් කරුවෙක් ම,**

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

II. තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන් ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

III. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතු ය.

IV. මෙම තනතුරු ස්ථිර තනතුරු වන අතර, සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් ලබයි.

V. ඉහත වැටුප් වලට අමතරව රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව සහ විශේෂ දීමනා ගෙවනු ලැබේ.

VI. රාජ්‍ය සේවයේ / සංස්ථාවල / ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුය.

VII. සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවීම් පත්වීම් බලධරයා විසින් ගනු ලබන තීරණ අනුව සිදු කරනු ලබයි.

- සම්පූර්ණ ජීවදත්ත ඇතුලත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම් සහතික, සේවා සහතික වල පිටපත් සමග ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සහිතව සකස් කල අයදුම්පත්‍රය ලියාපදිංචි තැපෑලෙන්, සභාපති, සී/ස නිපුණතා සංවර්ධන අරමුදල, "නිපුණතා පියස", 7 වන මහළ, අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05 යන ලිපිනයට 2024 ජුනි මස 12දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. තැපෑලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන **අයදුම්පත් පිළිබඳව සී/ස නිපුණතා සංවර්ධන අරමුදල වග කියනු නොලැබේ. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයට පසුව මෙම ආයතනයට ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.** අදාළ අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති,**
**සී/ස නිපුණතා සංවර්ධන අරමුදල.**
**"නිපුණතා පියස", 7 වන මහළ,**
**අංක 354 / 2, ඇල්විටිගල මාවත, කොළඹ 05.**
**දුරකථන : 011-2507815**

**දිනය : 2024-05-07**